ආහාර නිෂ්පාදනය කරන අයයි. ඒ අත්දැකීමත් එක්ක අපට පුළුවන් වුණා, කඩාගෙන වැටුණු කුකුළු කර්මාන්තය නැවත දියුණු කරන්න. ඒ අනුව මේ අවුරුද්ද ගත් විට, SAPP එකත් එක්ක එකතු වෙලා ගරු මන්ත්‍රීතුමිය ප්‍රකාශ කරපු කලාප තුළ බඩ ඉරිඟු වගා කරන්න දැන් සූදානම් කර තිබෙනවා. ඒ අස්වැන්න ලැබෙන්න තවත් මාස ගණනාවක් යනවා. මහ කන්නයේ වගා කළොත් මේ අවුරුද්දේ අන්තිම කාලය තුළ තමයි අපට බඩ ඉරිඟු අස්වැන්න ලැබෙන්නේ. සත්ත්ව නිෂ්පාදන ක්‍රියාවලිය කඩාගෙන වැටුණාම ඒක යථාවත් කරන්න අප ගත් ක්‍රියා මාර්ග වුණේ, මව් සතුන් වැඩිපුර ගෙනැල්ලා පැටවුන් ලබා දීම සහ සත්ත්ව ආහාර සුලබ කිරීමයි. අපේ රටට ඕනෑ කරන සත්ව ආහාර ලබා ගන්න මේ රටේ නිෂ්පාදනය කරන බඩ ඉරිඟු ප්‍රමාණවත් නැහැ. ඒ නිසා කැබිනට් මණ්ඩලයට කෘෂිකර්ම ඇමතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අනුව, කැබිනට් මණ්ඩලය තීන්දු කළා ආනයනකරුවන්ට සහ ලියාපදිංචි සංගම්වලට මේ සත්ව ආහාර ආනයනය කරන්න අවසර දෙන්න.

ඇයි අපි තීරු බදු සහන දෙන්නේ? කුකුළු කර්මාන්තයේ නිරත වෙලා ඉන්න අය එකඟ වෙලා තිබෙනවා මස් කිලෝ එකක් රුපියල් 100කින් අඩු කරන්නත්, ඒ නිෂ්පාදනවල මිල අඩු කරන්නත් සහන විධියට සත්ව ආහාර ලබා දෙන්න කියලා. අපි මේ වන විට ත්‍රිපෝෂ හදන්න බඩ ඉරිඟු ආනයනයට තීරු බදු සහන දීලා තිබෙනවා. ඒ කියන්නේ බඩ ඉරිඟු කිලෝවකට රුපියල් 75ට තිබුණු බද්ද රුපියල් 25කට අඩු කරලා තමයි ත්‍රිපෝෂ හදන්න බඩ ඉරිඟු ගෙනෙන්නේ. ඒ විධියටම තමයි කුකුළු කර්මාන්තයටත් මිල සහන දෙන්න කටයුතු කළේ.

විශේෂයෙන් මේ සහන දෙන කටයුත්ත කරන්නේ ස්වාධීන කමිටුවකින්. සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ස්වාධීන කමිටුවකින් තමයි මේක කරන්නේ. එහිදී ආනයනය කරන ප්‍රමාණයෙන් සත්ව ආහාර නිෂ්පාදනය කරන අයට සියයට 70ක් සහ සුළු කර්මාන්තවල නියුතු අයට සියයට 30ක් බැගින් දෙන්න තීන්දු කරලා තිබෙනවා. අපි බඩ ඉරිඟු මෙට්‍රික්ටොන් ලක්ෂ 2ක් ආනයනය කරනවා. සත්ව ආහාර නිෂ්පාදනය කරන අයට ඒකෙන් සියයට 70කුත්, ඊළඟට සත්ව ආහාර නිෂ්පාදනය කරමින් සුළු කර්මාන්තවල නිරත වෙලා ඉන්න අයට සියයට 30 ප්‍රමාණයකුත් සහන මිලට දෙන්න කටයුතු කරනවා. මේ කාරණා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ස්වාධීන කමිටුවක් විසින් තමයි තීරණය කරන්නේ. මේ විධියට ගෙන්වන බඩ ඉරිඟු සමහර කාලවල වෙන වෙන කර්මාන්ත සඳහා භාවිත කළා. නමුත් දැන් මේ ආනයනය කරන බඩ ඉරිඟු ඒ කණ්ඩායම් දෙකම සත්ව ආහාර හදන්න භාවිත කරනවාද කියන එක සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ඍජුවම අධ්‍යයනය කරනවා. පැහැදිලිවම මේ තීරු බදු සහන ලබා දීමේ ක්‍රියාවලිය සිදු කරන්නේ නිෂ්පාදකයාට සහන ලබා දීලා කඩාගෙන වැටුණු කුකුළු කර්මාන්තය දියුණු කරලා ඔවුන්ගේ නිෂ්පාදන -මස් සහ බිත්තර- අඩු මිලට පාරිභෝගිකයාට ලබා දීමේ අරමුණෙන්.

ඉතින්, ඒ කාරණාව ඒ විධියට විග්‍රහ කරලා තිබෙනවා. අමාත්‍යාංශයක් හැටියට මේ කටයුත්ත කළමනාකරණය කරන්න මැදිහත් වෙනවා මිස, මේ බඩ ඉරිඟු ආනයනය කිරීමට සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට තමයි නෛතික බලය තිබෙන්නේ. ඒ අනුව කටයුතු කරන්න ලැහැස්ති කරලා තිබෙනවා. වෙනත් කාරණා සඳහා මේ කටයුත්ත කරන්න සූදානම් නැහැ. උදාහරණයක් හැටියට කිව්වොත්, දැන් ලංකාවට මුං ඇට ගෙන්වනකොට තීරු බද්ද රුපියල් 300 දක්වා වැඩි කරලා තිබෙනවා. ඒක කරන්නේ ලංකාවේ නිෂ්පාදනය වැඩි කරන්න. ඊළඟට, ලංකාවට උඳු කිලෝ එකක් ගෙනෙනකොට බද්ද රුපියල් 225 ඉඳලා 300 දක්වා වැඩි කරලා තිබෙනවා. ඒ, ලංකාවේ දේශීය නිෂ්පාදනය වෙනුවෙන්. දේශීයව බඩ ඉරිඟු හදන්න විශාල කටයුතු ප්‍රමාණයක් කරන අතරේ, මේ කාල වකවානුව තුළ හිඟය පුරවන්න තමයි සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට බඩ ඉරිඟු ආනයනය කරන්න කැබිනට් අනුමැතියකින් නෛතික බලය දීලා තිබෙන්නේ. මේක විනිවිද භාවයෙන් කරන ක්‍රියාවලියක්. ඕනෑම කෙනෙකුට ඇවිල්ලා මේ පිළිබඳව අධ්‍යයනය කරන්න පුළුවන්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉන්දියාව අභ්‍යවකාශ - space - ගමනෙන් ලැබූ ජයග්‍රහණයට සුභ පතන්නට උදේ පාන්දරම මට අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මම විශේෂයෙන්ම මේ පාර්ලිමේන්තුව දැනුවත් කරන්න ඕනෑ, "Chandrayaan-1", "Chandrayaan-2" සහ "Chandrayaan -3" කියලා උත්සාහයන් තුනක් දරලා තමයි මේ කර්තව්‍යය ඉන්දියාව ඉෂ්ට කළේ කියන එක ගැන. ඒ, 2008, 2019 සහ 2023. මේ ක්‍රියාදාමයන් තුනටම වැය වෙලා තිබෙන්නේ ඇමෙරිකානු ඩොලර් මිලියන 263යි. හැබැයි, අපේ රටේ SupremeSAT ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න 2012දී ඩොලර් මිලියන 320ක් වියදම් කළා. මේක මුළු රටම දැනගන්න ඕනෑ. ලංකාවේ SupremeSAT ව්‍යාපෘතියට ඇමෙරිකානු ඩොලර් මිලියන 320යි, ඉන්දියාව ක්‍රියාදාම තුනටම ඩොලර් මිලියන 263යි. මම ගරු සභානායකතුමාගෙන් ඉල්ලීමක් කරනවා, අර SupremeSAT එක වෙනුවෙන් වියපැහැදම් කළ ඩොලර් මිලියන 320ට මොකක්ද වුණේ කියලා කරුණාකරලා මේ පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කරන්න කියලා. ඇමෙරිකානු ඩොලර් මිලියන 320ක් වියදම් කරලා හඳට යන එක නොවෙයි, රට වළ පල්ලට යන එක නම් කරලා තිබෙනවා.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා මා අමතා එම කාරණය ඉදිරිපත් කළ නිසා මම මේ පැහැදිලි කිරීම කරන්න ඕනෑ. ගරු විපක්ෂ නායකතුමනි, මම විද්‍යා හා තාක්ෂණ අමාත්‍යවරයා හැටියට 2015 ඉඳලා 2018 වෙනකල් ඔබතුමාත් එක්ක එකම ඇමති මණ්ඩලයේ කටයුතු කළා. හැබැයි, ඒ කාලයේ මගේ දැනුවත්භාවයක් තිබුණේ නැහැ, SupremeSAT එකක් ගැන. ඒකට හේතුව තමයි, විද්‍යා තාක්ෂණ අංශයෙන් මම විශාල ප්‍රයත්නයක් දැරුවා, ආතර් සී. ක්ලාර්ක් ආයතනයත් එක්ක, විශේෂයෙන්ම රුසියාවේ ROSCOSMOS ආයතනයත් එක්ක ඒ පිළිබඳව අධ්‍යයනයක් කරන්න. මොකද, ඇමෙරිකාවේ නාසා එක වාගේ තමයි රුසියාවේ ROSCOSMOS කියන්නේ. ඒවා අභ්‍යවකාශ ගවේශනය පිළිබඳව තිබෙන ආයතන. ඊළඟට, ආතර් සී. ක්ලාර්ක් ආයතනයේ ඉංජිනේරුවරු දෙදෙනෙක් ශිෂ්‍යත්වලාභීන් හැටියට ජපානයට ගිහිල්ලා යම් යම් තොරතුරු සොයා ගැනීම සඳහා මීට මාස කිහිපයකට පෙර නැනෝ තාක්ෂණයෙන් යුත් කුඩා චන්ද්‍රිකාවක් - nanosatellite එකක් - කක්ෂගත කළා. අපට ඕනෑ කළා, එතැනින් එහාටත් යන්න. ඒ පිළිබඳව අධ්‍යයනය කරන්න, පුහුණු වෙන්න අපේ ඉංජිනේරුවරු 23දෙනෙක් පමණ අපි රුසියාවට යැව්වා. එවැනි වැඩ පිළිවෙළක් තිබුණා. නමුත් මගේ නම් කිසිම දැනුවත්භාවයක් නැහැ, ලංකාවේ කවුරු හරි SupremeSAT කියලා චන්ද්‍රිකාවක් යැව්වාය කියන කාරණය ගැන. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟ කාරණය තමයි, -

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මම කියන්නේ 2012 වසරේදී.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
වෙන්න ඇති. 2012 දී ගියා නම්, මේ වෙනකොට හඳෙන් පසුත් ගේන කාලය හරි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වගේ ප්‍රබන්ධ කථා තිබෙන්නට පුළුවන්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ප්‍රබන්ධ කථා නොවෙයි, ඇත්ත කථා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඇමතිතුමනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
කවුරු හරි එහෙම කියන්න ඇති, ගරු විපක්ෂ නායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම අපේ අසල්වැසි ඉන්දියාවට මම සුබ ප්‍රාර්ථනා කරනවා, චන්ද්‍රයාන්-3 යානය ඉතාම සාර්ථකව සඳ මතට ගිහිල්ලා දක්ෂිණාර්ධගෝලයේ වැඩිදුර ගවේෂණ කටයුතු කිරීම සඳහා සාර්ථකව අත්හදා බැලීම ගැන. මෙහිදී මට මතක් වෙනවා, ඉන්දියාවේ හිටපු ජනාධිපති ආචාර්ය අබ්දුල් කලාම් මැතිතුමා. එතුමන් තුළ තිබුණා, "India 2020" කියන vision එක. දැන් ඒකෙනුත් ඔබ්බට ඉන්දියාව ගිහිල්ලා තිබෙනවා. ඉන්දියාවේ හිටපු ශ්‍රේෂ්ඨ විද්‍යාඥයකු වන අබ්දුල් කලාම් මැතිතුමා තුළ "India 2020" කියන vision එක තිබුණා. මම ඉන්දියාවට ගිය එක් අවස්ථාවකදී එතුමා මට මුණ ගැහිලා තිබෙනවා. එතුමා එදා දැකපු ඒ සිහිනය අද යථාර්ථයක් බවට පත්වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම නිසා මෙතැනදී යම් vision එකක් තිබෙන්නට ඕනෑ, visionary leadersලා ඉන්න ඕනෑ. ඒ අනුව තමයි ඒ රටවල් එවැනි ජයග්‍රහණ අත් පත් කරගෙන තිබෙන්නේ. අපටත් දැන් එතැනට යන්න කාලය උදාවෙලා තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, කාලය ගැන සැලකිලිමත් වෙලා කථා කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමා සඳහන් කළා, vision එකක් අවශ්‍යයි කියලා. මම හිතන්නේ, මොන එක තිබුණත් 2048 වෙනකොට අපි ඔක්කෝම මේවායින් ඔබ්බට ගිහිල්ලා ඉවරයි. රටත් එක්කම ඔබ්බට ගිහිල්ලා ඉවරයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ ඇමතිතුමා. ඔබතුමාගේ පැහැදිලි කිරීම කරන්න.

## අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## நீதி, சிறைச்சாலைகள் அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சரினது கூற்று
## STATEMENT BY MINISTER OF JUSTICE, PRISON AFFAIRS AND CONSTITUTIONAL REFORMS

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - நீதி, சிறைச்சாலைகள் அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சர்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC - Minister of Justice, Prison Affairs and Constitutional Reforms)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින ගරු සභානායකතුමා ඇතුළු කිහිපදෙනෙකුම අධිකරණයේ නියෝග පිළිබඳ කාරණා කිහිපයක් මා වෙත යොමු කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ සම්බන්ධයෙන් මාහට පැවසිය හැක්කේ මෙයයි. නියෝග නිකුත් කිරීම අධිකරණය විසින් ස්වාධීනව සිදු කරනු ලබන කාර්යයක්. අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126වැනි ව්‍යවස්ථාව අනුව මූලික අයිතිවාසිකම් නඩුවක් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කළාට පස්සේ මාස 2ක කාලයක් ඇතුළත ඒ පිළිබඳව නඩු තීන්දුවක් ලබා දිය යුතුයි. මම හිතන්නේ මේ පාර්ලිමේන්තුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පාදනය කරන අවස්ථාවේදී බලාපොරොත්තු නොවෙන්න ඇති, මූලික අයිතිවාසිකම් කඩ කිරීම් සම්බන්ධව විශාල නඩු සංඛ්‍යාවක් අධිකරණයට ගලාගෙන එයි කියලා. ඒ නිසා වෙන්න ඇති එවැනි සීමාවක් දාලා තිබෙන්නේ. එය ප්‍රායෝගික නොවන නිසා අධිකරණය නිරන්තරයෙන්ම එය අනිවාර්ය ලෙස අනුගමනය කළ යුතු කොන්දේසියක් විධියට සලකන්නේ නැහැ. ඒක නිසා එම නඩු අවුරුදු දෙකක්, තුනක්, හතරක්, පහක් අහන අවස්ථාත් තිබෙනවා.

එම ප්‍රශ්නය විසඳීම සඳහා විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාපු වෙලාවේ ගරු අලි සබ්රි ඇමතිතුමා විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරුන්ගේ සංඛ්‍යාව 11 සිට 17 දක්වා වැඩි කළා, අභියාචනාධිකරණයේ විනිසුරුවරුන්ගේ සංඛ්‍යාව 12 සිට 20 දක්වා වැඩි කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අතුරු නියෝග ලබා දීම පිළිබඳ කාරණය පාලනය වෙන්නේ, ශ්‍රේෂ්ඨාධිකරණ රීති අනුවයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් අධිකරණයට, ශ්‍රේෂ්ඨාධිකරණයට බලය ලබා දී තිබෙනවා, ඒ අධිකරණවල කටයුතු සිදු කිරීමේ ක්‍රියාකලාපය පිළිබඳව රීති හදාගන්න. අතුරු නියෝග ලබා දීම සම්බන්ධ කාරණාත් එහි සඳහන් වෙනවා. අතුරු නියෝගයක් ලබා දීමේ තේරුම තමයි, ඉතාම කෙටි කාලයකින් ඒ පිළිබඳව අවසන් නියෝගයක් ලබා දිය යුතුයි කියන එක. මෙතැනදී ප්‍රායෝගිකව මතු වුණු ප්‍රශ්නයක් තිබෙනවා. එය අපට උත්තර දෙන්න පුළුවන් ප්‍රශ්නයක් නොවෙයි. මොකද, විනිසුරුවරුන්ට තිබෙන මුක්තිය අනුව සහ ස්වාධීනත්වය උඩ තමයි ඒ අය කටයුතු කරන්නේ.

ශ්‍රේෂ්ඨාධිකරණයේ එක් විනිශ්චය ආසනයක් ලබා දෙන නියෝගයක් තවත් විනිශ්චය ආසනයක් විසින් අත්හිටුවනවා. ඒ වාගේ කාරණයක් නිසා තමයි අධ්‍යාපන ඇමතිතුමා කිහිප වතාවක්ම මතු කරන්නේ, අද මේ අතුරු නියෝග ලබා දීමේ හේතුව නිසා විදුහල්පතිවරුන් පත් කර ගන්න බැරිව සමස්ත